# ආයු අපේක්ෂාව උච්ඡාවචනය වීම කෙරෙහි බෞද්ධ ආචාරධර්ම මත ගොඩනැගුණු සෞඛ්‍යයෙන් වන බලපෑම

එම්.ජී.කේ. හසිනි - බෞද්ධ අධ්‍යයනාංශය

ආධ්‍යාත්මික වශයෙන් ආයු ලැබීමට යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම් සිදු කරන අතරම දීර්ඝායුෂ පැතීම උසස් මානුෂීය ගුණාංගයක් ලෙස සැලකිණි. එම පසුබිම පදනම් කර ගෙන බෞද්ධ ආචාරධර්ම මත ගොඩනැගුණු සෞඛ්‍යමය දියුණුව වර්තමානයේ ආයු අපේක්ෂාවෙහි වර්ධනයක් පෙන්නුම් කළද පුම්තිරිමය වශයෙන් ස්ත්‍රීන්ට සාපේක්ෂව පුරුෂ ආයු අපේක්ෂාවේ අඩුවීමක් පෙන්නුම් කරන්නේ මන්ද? යන ගැටලුවට විසඳුම් සෙවීම මෙම පර්යේෂණයේ ප්‍රමුඛ අරමුණ ලෙස පෙන්වා දිය හැකිය. එයට සමගාමීව, ආයු අපේක්ෂාව කාලීනව උච්ඡාවචනය වී ඇති ආකාරය, සෞඛ්‍ය හා පුද්ගල ආචාරධර්ම අතර පවත්නා සම්බන්ධය, පුම්තිරි ආයු අපේක්ෂාවේ පහළ යාම හා බෞද්ධ ආචාරධර්මවල බලපෑම මෙන්ම ආයු අපේක්ෂාව සම්බන්ධයෙන් අනාගතයෙහි හඳුනා ගත හැකි නව ප්‍රවණතා හා අභියෝග යනාදිය කෙරෙහි අවධානය යොමු කෙරිණි. තවද ප්‍රජාවිද්‍යාත්මක, සමාජවිද්‍යාත්මක, වෛද්‍යවිද්‍යාත්මක මෙන්ම ආයුර්වේදය යන විෂය සන්දර්භ ඔස්සේ පර්යේෂණයේ වැදගත්කම හඳුනා ගත හැකිය. පුද්ගල ආයු අපේක්ෂාව කෙරෙහි බලපෑම් කරන සමාජයීය හා මානසික සාධක බෞද්ධ දෘෂ්ටිකෝණයෙන් විමර්ශනය කිරීම පර්යේෂණයෙන් සිදුකෙරිණි. ඒ අනුව ආයු අපේක්ෂාවේ විචලනයන්, නව ප්‍රවණතා, අනාගත අභියෝග ශාස්ත්‍රීය වශයෙන් අධ්‍යයනයට බඳුන් කර ඇති හෙයින් පර්යේෂණය කාලීන වැදගත්කමක් ගනු ලැබීය. ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේද අනුව සිදු කරන ලද මෙම පර්යේෂණයෙහි ත්‍රිපිටක ග්‍රන්ථ ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන්ද විද්වත් පර්යේෂණයන්, සඟරා ආශ්‍රිත ලිපි, සංගණන වාර්තා මෙන්ම විද්වත් සාකච්ඡා ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ගනු ලැබීය. මෙහි දී පුම්තිරිමය ආයු අපේක්ෂාව ස්ත්‍රීන්ට සාපේක්ෂව පුරුෂ ආයු අපේක්ෂාව අඩු වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ලබන්නේ බෞද්ධ ආචාරධර්ම මත ගොඩනැගුණු පුද්ගල සෞඛ්‍යයෙහි පැවති පරිහානිකර තත්වයක් වශයෙන් දැක්වීම පර්යේෂණයේ කේන්ද්‍රිය තර්කය ලෙස පෙන්වා දිය හැකිය. යථෝක්ත කරුණු මත පදනම්ව පුද්ගල චර්යා ධර්මවල වෙනස්වීම සෞඛ්‍යය විෂයෙහි බලපෑම් කරන බවත් සෞඛ්‍යමය පරිහානිය පුද්ගලයාගේ ආයු සංස්ථාව පරිහානිය විෂයෙහිද සෘජු බලපෑමක් සිදු කර ඇති බවත් පැහැදිලි වේ. මේ ආකාරයට සෞඛ්‍යමය පරිහානිය අවම කර ගැනීමට බෞද්ධ ආචාර ධර්ම පුද්ගලයා තුළ වර්ධනය කළ යුතු අතර එය පුද්ගලයාගේ ආයු අපේක්ෂාව ඉහළ අගයක් ගැනීම විෂයෙහි ඉවහල් වන බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *පුම්තිරි, ආයු අපේක්ෂාව, ආචාරධර්ම, සෞඛ්‍ය, කාලීන උච්ඡාවචනය*